# අනුර ඉස්කෝලෙ යයි -අනුර කුමාර සිප්සත හැදෑරූ තඹුත්තේගම මැදි විදුහලේ ආදි සිසු හමුවේදී



අප අහම්බෙන් ජීවිත බේරා ගත් මිනිසුන්ය. දැන්නම් ගලේ ගැහුවත් අප විනාශ කළ නොහැකි බව යැයි ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක මහතා ඉකුත් 09 වැනිදා තඹුත්තේගම මැදි මහ විදුහලේ ආදි විද්‍යාර්ථයන් සංවිධානය කළ ආදි සිසු සුහද හමුවේදී තඹුත්තේගම වේරගල බෞද්ධ මධ්‍යස්ථානයේදී පැවසීය.

එහිදී වැඩිදුරටත් කතා කළ ඒ මහතා පවසා සිටියේ, මට ඉගැන්වූ ගුරුවරුන් අතරෙන් අද දින ගුරුවරුන් කීපදෙනකු හමුවීමට ලැබීම ඉතා භාග්‍යයක් බවද කියා සිටියේය. ඒ අතර මා සමග පාසල් ගිය සමකාලීන මිතුරන් රැසක් ද හමුවුණා. මරණය එළිපත දකිමින් අප කටයුතු කළා. සාමිණී ටීචර් ද ධර්මපාල ගුරුතුමා ද පරාක්‍රම ගුරුතුමා ද විසා සර් අමරසූරිය මහතා ද එම මැතිණිය ද අභාවප්‍රාප්ත වාසල විදුහල්පතිතුමා ද ඉලංගසිංහ ගුරුතුමා ද මට උදවු කළ බව සතුටින් දැන්වීමට කැමැත්තෙමි. සාමිණී ටීචර් තමයි අපගේ උසස් පෙළ පංතියේ භාරකාරිය වශයෙන් කටයුතු කර මෙම තත්ත්වයට පත් කළේ. මෙම සියලු දෙනාට ස්තූති කරනවා.

1988 - 1989 කාල වකවානුවේ දී සාමිණී ටීචර්ගේ ගෙදර රැගෙන ගොස් මා ආරක්ෂා කළා. දුම්රියෙන් මා කොළඹ රැගෙන ගොස් ආරක්ෂාව සැලසුවා.

රටේ පාලනය බලය අතට ගන්න ඉන්න අනෙක් අපේක්ෂකයන් ඉහළ පංතිවල වැජඹෙන රාජකීය, ශාන්ත තෝමස් පාසල්වල ඉගෙන ගත් අයයි. මා ඉගෙන ගත්තේ රජරට දුප්පත් තඹුත්තේගම ගාමිණී විදුහලේ සහ මධ්‍ය මහා විද්‍යාලයේය.

ගාමිණී මහා විදුහලේ සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ගත්තා. මා තඹුත්තේගම මධ්‍ය මහා විදුහලට ඉගෙනීමට පැමිණීමට පෙර උසස් පෙළ කිරීමට ළමයි ඇරියේ අනුරාධපුර පාසල්වලටයි. මා ආව කාලයේ ඉඳන් අනුරාධපුර පාසල්වලට යැවීම නවතා දමා තඹුත්තේගම උසස් පෙළ පන්ති ආරම්භ කළා. ඒ නිසා මා තඹුත්තේගම මැදි විදුහලේ උසස් පෙළ කළා.

අප ඉගෙන ගන්නා කාලයේදී අපේ ගෙවල්වල විදුලිය තිබුණේ නැහැ. ඉතා දුෂ්කරව අප ඉගෙන ගත්තා. ඒ කාලයේ විදුලිය තිබුණේ තඹුත්තේගම තැපැල් කාර්යාලයේ පමණයි. එම කාලයේදී එහි පැමිණ එම ලයිට් එළියෙන් පාඩම් කිරීම් සිදුකළා. 1988 - 1989 කාලවලදී සමකාලින මිතුරන් රාජ්‍ය හමුදාවන් විසින් ඝාතනය කළා. අපි ද යම්තමින් බේරුණා.

මේ රටේ පාලකයන් මෙතෙක් රට පාලනය කර ඇත්තේ පොදු ජනතාව ඇන්දවීමෙනි. මෙම ක්‍රමය වෙනස් කළ යුතුයි. එම අවස්ථාව අපට ලැබී තිබෙනවා. අපගේ යාළුවෝ අපට කියා තිබෙනවා මෙම ව්‍යායාමය අත්හැරිය යුතු බව. එහෙත් පෙර පාලනය අපට අමතක කළ නොහැක. අපේ භූමිය ආරක්ෂා කළ යුතුයි. විනාශ කිරීමට ඉඩ දෙන්න බැහැ. ජනතාවට හොඳ ජීවිතයක් ඇති කිරීමට ක්‍රියාකළ යුතුයි. අවු. 80 වැනි කෙටි කලක් තමයි අප ජීවත්වන්නේ. මිනිස්සුනට හොඳ ජීවිතයක් ලබා දිය යුතුයි. පැරණි තීන්දු අත්හැරදමා නව තීන්දු ගත යුතුයැයි කීය.

මෙම උත්සව අවස්ථාවේදී අනුර කුමාර දිසානායක මහතාට පාසල් අධ්‍යාපනය ලබාදුන් ගුරුවරුන් රැසක් ද සමකාලීන මිතුරන් කීපදෙනකු ද වෙහෙරගල විහාරාධිපති තඹුත්තේගම දමිත හිමියෝ ද කතා කළහ.

තවද මෙම විදුහලේ ආදි සිසුවකු වූ අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති ජාතික ජන බලවේගයේ විධායක සභික වසන්ත සමරසිංහ මහතා ද මෙම අවස්ථාවට සහභාගි වී අදහස් දැක්වීය.

**තඹුත්තේගම - සී.එම්. ආරියපාල**


Sanka Law Professional Corporation



"Cost effective legal advice in a timely manner"

- Real Estate
- Family Law
- Wills, Powers of Attorney and Estates
- Business Law
- Notary Public Services

Sanka Wijeratne, LL.B.
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC

OFFICE
50 Nashdene Road
Unit 104
Toronto ,ON M1V 5J2
Tel: 416-494-9183
Fax 1 866 494 9389
E mail : info@sankalaw.com Web : http://www.sankalaw.com

Services are available in Sinhala, Tamil (by appointment only) and English. Evening and weekend appointments are available.